## ඇස්. මහින්ද හිමි

තෂිනම්ගල් මෙහි නැවතී
බුදු දහමට ඇල්ම ඇතිව
එස් මහින්ද යන නාමෙන්
මහණවුණා සසුන් කෙතෙහි

සිහල රටේ සිහල දනන්
අවදි කළේ කවි දැහැනින්
නිදහසෙ වටිනා පැත්තට
තල්ලු කළා දනෝ පෙරට

ටිබෙට් සමිඳු එස් මහින්ද
කඩා දමා සිහල නින්ද
අවදි කළා රටේ සැවොම
කළ සේවය හරි අනගිය.

♦ ***වින්ද්‍යා සිතාරා ප්‍රේමරත්න***
නාලන්දා ම ම විද්‍යාලය
මිනුවන්ගොඩ Sri Lanka

## පුංචි මල්ලි මගේ....

රෝස මලක් වගේ සුවඳ මල්ලියා
පිච්ච මලක් වගේ සුවඳ මල්ලියා
කඩියා වගේ හරි කඩිසර මල්ලියා
නිතරම සතුටින් ඉන්නා මල්ලියා

♦ ***සචිනි විමන්ති විජේසේකර***
වේරහැර විද්‍යාලය
බොරලැස්ගමුව Sri Lanka




***Children's Corner***

## Largest Flower ලොව ලොකුම මල



The world's largest flower, rafflesia arnoldi, weighs 15 lb and is found only on the Indonesian island of Sumatra. Its petals can be up to 1ft 6in long and one inch thick. It is named after the naturalist Sir Stamford Raffles, who founded Singapore in 1819. Also called corpse flower, it reeks to attract flies for pollination.

**ලො**ව ලොකුම මල රෆ්ලේසියා ආර්නෝල්ඩි නම් වේ. එය රාත්තල් 15 ක් බරය. පිපෙන්නේ ඉන්දුනීසියන් දූපතක් වන සුමාත්‍රාවලය. මල්පෙත්තක් අඩියකුත් අඟල් 6 ක් පමණ පළල වන අතර ඝනකම අඟලකි. මේ මලට ඒ නම යොදා ඇත්තේ 1819 දී සිංගප්පූරුව නිර්මාණය කළ සර් ස්ටැම්ෆර්ඩ් රැෆල්ස් සිහිවීම පිණිසය. පරාග පෝෂණය පිණිස මැස්සන් ඇද ගැන්ම සඳහා මේ මලෙන් දුර්ගන්ධයක් නික්මෙන්නට පටන්ගන්නේය. ඒ හේතුවෙන් මේ මල් මිනීමල් යනුවෙන්ද හඳුන්වති.

♦ ***Auntie Ramani ( රමණී නැන්දා )***

## වීදි කලාකරුවා

පවනේ මුසුව යන වස්දඬු නාද යට
ඔහු එක්කරයි ගී පදවැල් තාල යට
විඩාබර සිතට ගෑ ඔසුවක් ලෙසට
සවන් සැනසේවි මේ ගී තාල යට

දුප්පත්කමට වස් දඬුවක් රැගෙන යන
යාචකයෙක් නොවේ ඔහු මගතොට යනෙන
ලැබෙන සොච්චමෙන් තම දිවි ගැට ගහන
වීදි කලාකරුවෙකි ඔහු සදා තන

♦ ***පවිත්‍රා සාරංගී වෙරළුපිටිය***
*මධ්‍යමහා විද්‍යාලය*
*පිලියන්දල Sri Lanka*

## ගල



මහා කැලයක නිදා සිටිනු බෑ
සිහිල් පවනක් සුව නොදෙයි
පාර අයිනට යාමෙ අටියෙන්
බලා සිටියෙමි කලක් තිස්සේ
හෙණ ගිගුම් දී මහා වරුසා
ඇද හැලුණි මා තුටුකරවමින්
කලක් තිස්සේ බලා සිටි මා
එතැනටම ගොස් නැවතුණා
මගේ සුදු ඇඟ කළු දුමින් දැන්
කළුවෙලා ඉවසනු කෙසේ
මහා සෝෂා දරාගනු බෑ
නෙයෙක් දන යයි පය ගසා

♦ ***අනුරුද්ධිකා ලක්මාලි ප්‍රේමරත්න***
සංඝබෝධි මැදිමහ විදුහල - මිණිපෙ Sri Lanka


ලංකා බැංකුව
BANK OF CEYLON

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

***ලන්ඩන් ශාඛාව***

***ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරිමේ මහඟු අවස්ථාවක් !***

* ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.

* ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.


1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* HSBC, NATWEST, BARCLAYS *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*

HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624
NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732
BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859

No 1, Devonshire Square, London EC2M 4WD
Phone : 020 7377 1888 Fax: 020 7377 5430
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit


# ග්‍රේෂන් ආනන්ද ඉතින් නැත!



**ශ්‍රී**ලංකා සංගීත ක්ෂේත්‍රය දැඩි සංවේගයට හා පාළුවට පත්කරමින් ගිය සතියේ දක්ෂ ගායකයෙකු, වාදකයෙකු හා සංගීත අධ්‍යක්ෂකවරයෙකුද වන ග්‍රේෂන් ආනන්ද මහතා ජීවිතයෙන් සදහට සමුගත්තේය. ගිලන්ව අසාධ්‍ය තත්වයේ පසුවූ ග්‍රේෂන් කොළඹ ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිට දෙසැම්බර් 29 වෙනිදා අභාවප්‍රාප්ත විය. මියෙන විට ඔහුට වයස 52 කි.

ජනප්‍රිය ගීත දෙසීයකට වඩා ගායනාකර ඇති ග්‍රේෂන් මුලින්ම සංගීත ලෝකයට පිවිසියේ ගිටාර්වාදකයෙකු හැටියටය. ඔහුට වූයේ මන බඳින කටහඬකි. නොබෝ කලකින් ග්‍රේෂන් ගායකයෙකු ලෙස ශ්‍රීලංකාවේ රසික ජනාදරය ලැබුවේ ය. ප්‍රවීන ගායන ශිල්පි එච්. ආර්. ජෝතිපාලයන්ගේ අභාවයේ අඩුව පුරවන්නට සමත් එකම ශිල්පියා ග්‍රේෂන් බව සංගීත ලෝකයේත් රසිකයින්ගේත් පිළිගැනීම විය.

ග්‍රේෂන්ගේ ගම නුවරය. ඔහු නුවර සිට කොලොන්නාවට පැමිණියේ කුඩා කලදීම ය. ඒ සමයේ සිටම ඔහු ඉමහත් ඇල්මක් දැක්වූයේ ගිටාරයටය. ඔහුගේ සංගීත හැඩගැස්මට පිටිවහලක් වූයේ සරත් දසනායක සහ ස්ටැන්ලි පීරිස් ආදී සංගීතඥයින්ය. ඔවුන්ගේ මගපෙන්වීම යටතේ ඔහු වාදකයෙකු සේම ගායකයෙකු වශයෙන්ද ඉදිරියට ගියේය. ලතා වල්පොල, නීලා වික්‍රමසිංහ, ඉන් ද්‍රානි පෙරේරා, චන්ද්‍රිකා සිරිවර්ධන, ඇන්ජලින් ගුණතිලක ඇතුළු ප්‍රවීන ගායිකාවන් රාශියක් සමග ඔහු යුගගීත ගයා තිබේ. 1992 දී ග්‍රේෂන් වසරේ හොඳම ගායකයාට හිමි සරසවි සම්මානයෙන්ද පිදුම් ලැබුවේය. ඒ **උමයංගනා** නමැති චිත්‍රපටයට ඔහු ගැයූ **ලියතඹරා ඔබයි** නමැති ගීතය වෙනුවෙනි. ඔහු චිත්‍රපට සංගීත අධ්‍යක්ෂකවරයෙකු ලෙස ඉදිරියට ආවේ 1986 දී **රන්දෙනිගල සිංහයා** නමැති චිත්‍රපටයෙනි. ඔහුගේ අකල් වියෝගය අප රටට සැබෑ පාඩුවකි.

ග්‍රේෂන් ආනන්ද කලාකරුවාණන්ට උතුම් නිවන් සුව පතමු!

***ග්‍රේෂන් ආනන්ද මහතාගේ පාසැල්වියේ මිතුරෙකු විසින් ඔහු පිළිබඳව ලියන ලද විශේෂ ලිපියක් ලංකාවිත්ති ලබන කලාපයේ පළවනු ඇත.***

# අවමංගල්‍ය Obituary

## Mrs Sita Lilly Jayasundara
## සීතා ලිලී ජයසුන්දර මහත්මිය



**අභාවප්‍රාප්ත සරත් කුමාර ජයසුන්දර මහතාගේ ආදරණීය භාර්යාව වූද, අනෝමා, කුමාරි, සුරංගි සහ සම්පත්ගේ ආදරණීය මෑණියන් වූද, අනුර හෑගොඩ, කීර්ති රණසිංහ, රිචර්ඩ් ජෝන්ස්ටන්ගේ සහ සමන්තාගේ දයාබර නැන්දනිය වූ ද, අනෝමලී, අනුත්තරා, සන්තෝෂ්, හන්සි, ඉයෝනා සහ යෙනුලාගේ ආදරණීය ආච්චි අම්මා වූ ද, සීතා ලිලී ජයසුන්දර මහත්මිය 76 වසක් ආයු වළඳා අභාවප්‍රාප්ත වූවා ය. අවමංගල්‍ය කටයුතු 2011 ජනවාරි 9 වෙනි දින කොළඹ බොරැල්ල කනත්තේ දී සිදුවී ය.**

සීතා ලිලී ජයසුන්දර මහත්මිය දක්ෂ කිවිදියකි. ඇය ලංකාවිත්ති පුවත්පතේ සුහද පාඨකයෙකි. එසේම ඇය විසින් රචනාකරන ලද කාව්‍ය පන්ති ලංකා විත්ති පුවත්පතේ පළවී ඇත. මේ මෑතක ඇය **කඳුලැලි** නමින් කාව්‍ය සංග්‍රහයක් ද මුද්‍රණයෙන් එළිදැක්වූවා ය. සිංහළ කවියට ඉමහත් ඇල්මක් දැක්වූ මේ කිවිදිය කාරුණික සෞම්‍ය ගතිගුණවලින් යුක්ත ය.

ගියවසරේ ලන්ඩනයේදී සිය 75 වෙනි උපන්දින සැමරුම ඇයගේ දියණියගේ නිවසේ පැවති වෙලේ ඇයට සුබපතන්නට පැමිණි අය අතර මම ද වීමි. ළඟින් හිඳිමින් බොහෝ වේලාවක් කවි ගැනම ඇය මා හා කතා කළ අයුරු මට සිහිපත්වේ. එදින සිය දියණියන්, බෑණාවරුන්, මුනුබුරු මිනිබිරියන්ගේ කවි, ගී, ගැයුම්, වැයුම් හා නැටුම් පිරි ඒ සන්ධ්‍යාවේ ඇය සිටියේ අතිශය ප්‍රමෝදයෙනි. මේ හදිසි වියෝගය අපට සිතාගන්නටවත් බැරි ය.

**සීතා ලිලී ජයසුන්දර මහත්මියට උතුම්වූ නිවන් සුව අත්වේවා !**

♦ ***දයා***


***Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි***
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk